# මහවැලි නිම්නයේ පුරාණ ජනාවාසකරණය හා වාරි කර්මාන්තය

චන්දන රෝහණ විතානාච්චි

## භෞතික ස්වභාවය

මහා ගංගා, මහාවාලුකා ගංගා හා ගංගා ආදී විවිධ නාමයන්ගෙන් වංශකථාවල හඳුන්වා තිබෙන මහවැලි ගඟ ශ්‍රී ලංකාවේ විශාලතම හා දීර්ඝතම ජල මාර්ගය වේ. එය දිගින් කි.මී. 331 (සැතපුම් 206) කි. විශාලත්වයෙන් වර්ග කි.මී. 10,440 (ව.සැ. 4034) පුරා පැතිරෙන මහවැලි නිම්නය දිවයිනේ මුළු බිම් ප්‍රමාණයෙන් $^{1}/_{6}$ පමණ ප්‍රදේශයක් වසා පැතිර තිබේ. කඳුකර තෙත් කලාපයෙන් ආරම්භ වී කඳුකර වියළි කලාපය ඔස්සේ අඩතැනි පසුකර තැනිතලා බිම් හරහා ගලා ගොස් නැගෙනහිර වෙරළින් මුහුදට එකතු වන මහවැලි නදිය මගින් වාර්ෂික ව අක්කර අඩි 4306ක ජල ප්‍රමාණයක් මුහුදට එක් කරයි (Arumugam 1969:4). තොටපලකන්ද, පිදුරුතලාගල ආශ්‍රිත දියතුවලින් ආරම්භ වන මහවැලි නදියේ දක්නට ලැබෙන්නේ වලයාකාර ජලවහන රටාවකි. කොත්මලා ඔය, අග්‍රාඔය හා දඹගස්තලාව ඔය වැනි ජලමාර්ග මඟින් ඉහළ කඳුකර ප්‍රදේශයේ ජලය මහවැලි ගඟට එකතු වේ.

කටුගස්තොට ප්‍රදේශය දක්වා උතුරු-ඊසාන දිශානුගත ව ගලන මහවැලි නදිය ඉන් පසු දුම්බර මිටියාවත දිගේ ගිනිකොණ දෙසට ගලා බසියි. කටුගස්තොට ප්‍රදේශයේ සිට දක්නට ලැබෙන්නේ දැඩි බෑවුම් සහිත ප්‍රදේශයක් ඔස්සේ ගලා යන මහවැලි නදියයි. මේ නිසා ගැඹුරු නිම්න, දොරොව් හා සැඩපහර වැනි ලක්ෂණ ගංගාවේ දක්නට ලැබේ. මෙම කොටසේ ඉහළින් ම තලාතුඔය හා මහඔය මහවැලි ගඟට එකතු වන අතර, ඊට පහළින් නකල්ස් කඳුවැටියේ සිට ගලා එන හුළුගඟ, ගල්මල්ඔය සම්බන්ධ වේ. වික්ටෝරියා දියඇල්ලෙන් පසු බටහිර දිශානුගත ව ගමන් කරන මහවැලි ගංගාවට උමාඔය, බදුලුඔය හා ලොග්ගල් ඔය එකතු වේ. ලොග්ගල්ඔය එක් වන ස්ථානයේ දී නැවත දිශාව වෙනස් කරන මහවැලි නදිය ඍජු මඟක් ඔස්සේ උතුරු දෙසට ගමන් කරයි. ඉන් පසු හසලක ඔය, හීන්ගඟ හා උල්හිටියා ඔය මහවැලි ගඟ සමග සම්බන්ධ වේ.

මහවැලි ගඟේ ප්‍රධාන ශාඛාව වූ අඹන්ගඟ අතීතයේ දී හඳුන්වා ඇත්තේ කාරගංගා යනුවෙනි. එය මහවැලි නදියට එකතුවන්නේ පෙළොන්නරුවට ආසන්න තැනිතලා ප්‍රදේශයේ දීය. අඹන්ගඟ දිගින් කි. මී. 52 ක් පමණ වේ. එයට විශාල පෝෂක ප්‍රදේශයක් ද වේ. මාතලේ නිම්නයේ හා දුම්බර කඳුවැටියේ උතුරු ප්‍රදේශයේ ජලවහනය අඹන් ගඟ මගින් සිදු කරනු ලබයි. නාලන්දා ඔය, සුදුගඟ හා නැලිගම් ඔය අඹන් ගඟේ ප්‍රධාන ශාඛාවෝ වෙති. අඹන් ගඟ එකතු වන ස්ථානයේ සිට මහවැලි නදිය පුළුල් තැනිතලා භූමියක් ඔස්සේ ගමන් කරන අතර ක්‍රමයෙන් එහි පළල ද වැඩි වේ. මෙම කොටසේ දී මහවැලි ගඟට කවුඩුලු ඔය එකතු වේ. මෙම තැනිතලා ප්‍රදේශයේ ඊසාන දිශාවට වන්නට මහවැලි ගඟ අප ශාඛාවන්ට බෙදීම සිදු වන අතර, පෙරිය ආරුව, කන්දකාඩු ඇළ හා වෙරුගල් ආරුව ද මෙයට අයත් වේ. මහවැලි නදියේ ප්‍රධාන මුවදොර පිහිටා ඇත්තේ මූතූර් අසල කොඩ්ඩියාර් බොක්කෙහි ය. උප්පු ආරු ඇළ ද මෙහි තවත් මුවදොරකි.

මහවැලි නිම්නය මඟින් ආවරණය කෙරෙන විශාල භූමි ප්‍රදේශය හේතුවෙන් විවිධ භූ රූපණ රටාවන් ඒ තුළ නිරූපණය වේ. මහවැලි නිම්නය පිහිටා ඇති භූමිය මූලික වශයෙන් අයත් වන්නේ උස්බිම් ශ්‍රේණිය නමින් හැඳින්වෙන පාෂාණ සංයුතියෙන් නිර්මාණය වී ඇති කොටසට ය. එම උස්බිම් ශ්‍රේණිය දෙපස විජයානු ශ්‍රේණිය ලෙස හඳුන්වන පාෂාණ කලාපය පිහිටා ඇත. මහවැලි ද්‍රෝණියේ ප්‍රාග් කේම්බ්‍රීය සාධකවලට අමතර ව ප්ලයිස්ටොසීන අවධියෙන් පසු තැන්පත් වූ ගංගා දියළු හා බොරළු වැනි නිධි හැරුණු විට වෙනත් සාක්ෂි දුර්ලභය. මහවැලි නිම්නය පුරා බෙහෙවින් ම දක්නට ලැබෙන්නේ නිර්මාණක ලක්ෂණවලට වඩා නග්නීකාරක ලක්ෂණයන්ය.

ශ්‍රී ලංකා ඉතිහාසයේ ඉතා වැදගත් ස්ථානයක් මහවැලි නදියට හිමි ව තිබේ. එය රජරට හා රුහුණු රට එකිනෙක වෙන් කරන සීමාව ද විය. වංසකථාගත තොරතුරු අනුව මහවැලි නිම්නය අනුරාධපුර මුල් යුගයේ සිට ම ඓතිහාසික වශයෙන් වැදගත් වී තිබේ (නිකොලස් 1979:41-9,213-220). පහළ හා මධ්‍ය මහවැලි නිම්නයේ ජනාවාස විශාල ප්‍රමාණයක් පැවති බව එම කලාපයෙහි ව්‍යාප්ත ව තිබෙන පූර්ව බ්‍රාහ්මී හා අපර බ්‍රාහ්මී ශිලා ලේඛනවලින් තහවුරු වේ (Paranavitana 1958). පහළ නිම්නබද භූමිය පුරා දක්නට ලැබෙන පැරණි වාරි මාර්ග පිළිබඳ ව වන සාක්ෂිවලින් ද මේ බව සනාථ කරගත හැකිය. එම වාරි නටබුන්වලින් පැහැදිලිවන්නේ මහවැලි නදිය හා එහි අතුගංගාවලින් වාර්ෂික ව මුහුදට එකතු වන විශාල ජල ප්‍රමාණයෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කර තිබෙන බවය. ඒ සඳහා පැරැන්නන් වැඩි වශයෙන් අමුණු උපයෝගී කරගෙන තිබෙන බව පැහැදිලිය. මිණිපේ අමුණ හා යෝධ ඇළ, මාපාකඩ වැව, සොරබොර වැව, හත්තොට අමුණ, ඇළහැර අමුණ හා ඇළ, ගිරිතලේ වැව, මින්නේරිය වැව, මින්නේරිය කන්තලේ, යෝධ ඇළ, කවුඩුල්ල වැව, අංගම්මැඩිල්ල අමුණ හා ඇළ, පරාක්‍රම සමුද්‍රය, කාලිංග අමුණ හා ඇළ වැනි විශාල ප්‍රමාණයේ වාරි මාර්ග ගණනාවක්ම පුරාණයේ දී මහවැලි නදිය හා එහි ශාඛා ගංගාවන් ආශ්‍රිත ව ක්‍රියාත්මක වී තිබේ.

## ඓතිහාසික ජනාවාසකරණය

පුරාණයේ දී රජරට හා රුහුණු සීමාව වෙන් කෙරෙන සීමාව වූ මහවැලි නදිය අනුරාධපුර රාජධානිය ආරම්භයේ සිට ම විවිධාකාරයෙන් වැදගත් වූ බවට සාක්ෂි වංසකථා මූලාශ්‍ර හා සෙල්ලිපි ආශ්‍රයෙන් අනාවරණය කරගත හැකිය. පූර්ව අනුරාධපුර අවධියේ දී මහවැලි මෝය ප්‍රදේශය වැදගත් තොටමුණක් වූ බව පැහැදිලිවන්නේ ඉන්දීය ජන සංක්‍රමණිකයන් අතර සිටි භද්දකච්චාන කුමරිය ඇතුළු ජන කණ්ඩායම ගෝකණ්ණ පටුනින් මෙරටට පැමිණීමේ පුවතත් සමගය (ම.ව. පරි.8:ගාථා;5-23). ක්‍රිස්තු පූර්ව දෙවන සියවසේ දුටුගැමුණු අවධියේ දී මෙන් ම ක්‍රි. ව. 12 වන සියවසේ පරාක්‍රමබාහු රාජ්‍ය අවධියේ දී ඇති වූ යුදමය අවස්ථාවල දී මහවැලි ගංගා තීරය ආරක්ෂා කිරීමට ගත් පියවර පිළිබඳ ව වංශකථාවේ සඳහන් තොරතුරුවලින් පැහැදිලිවන්නේ මෙම ගංගා නිම්නයේ පැවති උපයෝගීතාවයය (ම.ව. පරි.8:ගාථා.25.7-20,72. 1100).

වංසකථා තොරතුරු ඇසුරින් මහවැලි නිම්නයේ පිහිටි පැරණි ජනාවාස විශාල ප්‍රමාණයක් පිළිබඳ ව අනාවරණය කරගත හැකිය. මින් ඇතැම් ස්ථාන ආශ්‍රිත ව ආරක්ෂිත බලකොටු පිහිටා තිබුණු අතර සමහර ප්‍රදේශවල නොයෙක් රජවරුන් විසින් වෙහෙර විහාර, වැව් අමුණු ඉදිකළ බවට තොරතුරු හමුවේ. දුටුගැමුණු රාජ්‍ය අවධියේ දී මෙම නිම්නයේ පැවති බලකොටු රාශියක් පිළිබඳ ව මහාවංශයේ සඳහන් වේ. මියුණුගණ හෙවත් මහියංගනය, අම්බතිත්ථක හෙවත් අඬතොට, අන්තරාසොබ්බ හෙවත් අතුරුහෙබ, ද්‍රෝණ හෙවත් දෙනගම, හාලකෝළ හෙවත් වහල්කොළ, නාළිසොබ්බ හෙවත් නැලිහෙබ, දීඝ් අබාගල, කච්ඡතිත්ථ හෙවත් කසාතොට, ගාමිණීගම, කෝටනුවර, කුම්බගාම හෙවත් කුඩගම, තඹගම, ජම්බුගාම හෙවත් දඹුන්නරුව හා උන්නගාම (ම.ව. පරි.8:ගාථා.25.7-15) යන බලකොටු සියල්ල මහවැලි ගඟ ආශ්‍රිත ව පැවත තිබේ. විජිතනුවර හෙවත් කඳවුරුපිටි බලකොටුවත්, කහලනගර බලකොටුවත් පිහිටා තිබුණේ මහවැලි ගඟේ ප්‍රධාන ශාඛාව වූ අඹන්ගඟ නිම්නයේය.

පළමුවන පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ දී යුදමය වශයෙන් වැදගත් වූ ප්‍රදේශ ගණනාවක් ද මහවැලි නිම්නයේ ස්ථානගත ව තිබේ. වල්ගම්තොට, තලනිගාමය, සමීරුක්ඛ නම් තොට හෙවත් වර්තමාන හැබරව, මහාරුක්ඛ නම් තොට හෙවත් මාරක, නාලිසොබ්බ හෙවත් පොල්වත්ත, කාණනාලවන, යක්ඛසූකර හෙවත් යක්කුරේ, වෙහෙරවෙදහල් නම් තොට, අස්සමණ්ඩල හෙවත් අස්මඩලාතොට, විල්ගම්තොට, සුළුනාතොට, නිකවැලිතොට, බිල්පත්කඩ, නන්දිගාම, හෙදිලිකඩගම, බිල්ලගාමතොට හෙවත් බෙල්ගමුතොට, මල්ගමුතොට, ගොලබාන තොට නම් ස්ථාන පිළිබඳ ව මහාවංශයේ සඳහන් ව ඇත (ම.ව. පරි.8ඃගාථා.72.33-85).

මහවැලි නිම්නයේ පිහිටි අන්තරාසොබ්භයේ පස්වෙනි අග්ගබෝධි (718-724) රජු විසින් දේව නමින් විහාරයක් කරවා ඇත (ම.ව. පරි.48ඃගාථා.4). මහාරුක්ඛි සමීපයේ පිහිටි නීලගාමයේ පළමුවන උදය (797-801) රජු නීලගල්ල විහාරය ඉදිකොට ඇළ මාර්ගයක් එයට පූජා කළ බව සඳහන් වේ (ම.ව. පරි.49ඃගාථා.31). මහාචූලිකමහාතිස්ස (ක්‍රි. පූ. 77-63) රජු විසින් දීඝාභයගල්ලක ප්‍රදේශයේ විහාර දෙකක් කරවූ බව සඳහන් ව ඇත (ම.ව. පරි.34ඃගාථා.8). තුන්වන දප්පුල (ක්‍රි. ව. 815-831) රජුගේ විජිත නම් සෙනෙවියකු මෙහි කච්ඡාවාල නමින් විහාරයක් කරවා ඇත (ම.ව. පරි.49ඃගාථා.80). මහවැලි නිම්නයේ මහගන්තොට ප්‍රදේශයේ පිහිටි නන්දිගාමයේ සුභ (ක්‍රි. ව. 60-77) රජු නන්දිගාමන විහාරය කරවා තිබේ (ම.ව. පරි.35ඃගාථා.58). සහස්සතිත්ථ හෙවත් දාස්තොට මධ්‍යකාලීන අවධියේ දී වැදගත් ආගමික මධ්‍යස්ථානයක් විය (ම.ව.,පරි.87ඃගාථා.72-4).

මහවැලි නිම්නයේ පැරණිතම ජනාවාස පිළිබඳ ව තොරතුරු වංසකථා අනුව වාර්තාවන්නේ මහියංගන ප්‍රදේශයෙනි. බුදුන්වහන්සේ මහියංගනයට වැඩම කොට යක්ෂයින් දමනය කළ බව මහාවංසයේ දැක්වේ (ම.ව. පරි.1ඃගාථා.19-43). මෙහි සඳහන් යක්ෂයින් යනු යක්ෂ ගෝත්‍රිකයින් විය හැකි බවත්, ඔවුන් මහියංගනය ප්‍රදේශයේ මහවැලි ගඟ ආශ්‍රිත ව ජීවත්වන්නට ඇති බවත් සිතිය හැකිය. පූර්ව අනුරාධපුර අවධියේ සිට මහවැලි නිම්නයේ ජනාවාස පැවති බවට සාක්ෂි ඇත. ඉන්දීය ජන සංක්‍රමණිකයින් පිරිසක් වූ භද්දකච්චානා කුමරිය ඇතුළු පිරිසක් මහවැලි ගං මෝය ප්‍රදේශයේ වූ ගෝකණ්ණ තොටුපළින් මෙරටට පැමිණි බව සඳහන් වේ (ම.ව. පරි.8ඃගාථා.23-5). පණ්ඩුකාභය රාජ්‍ය සමය වන විට මහවැලි නිම්නය ආශ්‍රිත ප්‍රදේශය ජනාවාස ව පැවති බවට තොරතුරු ලබා ගත හැකිය. මෙම නිම්නයේ පිහිටි දිඹුලාගල අතීතයේ දී හඳුන්වා ඇත්තේ දූමරක්ඛගල ලෙසිනි. පණ්ඩුකාභය කුමාරයා හා සම්බන්ධ වන දොලුගල, තිඹිරියහනවිල හා කච්ඡකනම් තොට දූමරක්ඛගල ආශ්‍රිත ව පැවත තිබේ (ම.ව. පරි.10ඃගාථා.53,57,59,62). දිඹුලාගල, දූමරක්ඛ පබ්බත හෙවත් උදුම්බර පබ්බත ලෙසින් ද හඳුන්වා ඇත. ක්‍රිස්තු පූර්ව යුගයේ අවසාන භාගයට අයත් පූර්ව බ්‍රාහ්මී ලෙන් ලිපි ගණනාවක් ද ඒ ආශ්‍රිත ව දක්නට ලැබේ (I.C.Vol.I,No.272-87).

මහවැලි ගඟේ දකුණු ඉවුර ආශ්‍රිත ව පිහිටි මුතුගල පැරණි විහාරයක නටඹුන් දක්නට ලැබෙන අතර ක්‍රි. පූ. දෙවන සියවසේ සිට ක්‍රි. ව. හත්වන සියවස දක්වා සෙල්ලිපි රාශියක් ද දක්නට ලැබේ. එම සෙල්ලිපිවල කොඩිකටන, වළගරින යන ස්ථාන නාම ද විජිරිබූපවනගල නමින් වූ විහාරයක් පිළිබඳ ව ද, පනනමක නමින් වූ වැවක් සම්බන්ධයෙන් ද සඳහන් වේ (නිකොලස් 1961:46). මුතුගලට ආසන්නයේ වූ කුරුණාකල්ලු යන ස්ථානයේ ක්‍රි. පූ. දෙවන සියවසට අයත් ලිපියක ග්‍රාම ශ්‍රේණීන් විසින් පූජා කරන ලද ලෙනක් පිළිබඳ ව සඳහන් වේ (ASCAR 1897:11). මහවැලි ගඟ හා මාදුරු ඔය අතර වූ ප්‍රදේශය පුරාණයේ දී අන්තරගංගා නමින් හඳුන්වා තිබේ. දිඹුලාගල ආසන්නයේ පිහිටි මෝලාහිටිය වෙලේගල ලිපියක මෙම නාමය සඳහන් වේ (E.Z.Vol-III:153). ක්‍රි. පූ. පළමුවන සියවසේ සිට ක්‍රි. ව. දෙවන සියවස දක්වා සෙල්ලිපි මෙම ස්ථානයේ ඇත. ඉන් එක් ලිපියක දුබලගම නම් ප්‍රදේශයක් පිළිබඳ ව සඳහන් වේ (I.C.,Vol-II,No.3). තවත් ලිපියක අනුරවික හා නිකවිලි නම් ස්ථාන නාම දෙක සඳහන්ව ඇත (E.Z.Vol-III:154). අන්තරාගංගා විහාරයට තුන්වන ජෙට්ටතිස්ස (ක්‍රි. ව. 628) රජු විසින් චුල්ලමානික ග්‍රාමය පූජාකර තිබේ (ම.ව. පරි.42ඃගාථා.100).

මහවැලි ගඟේ වම් ඉවුරේ වර්තමාන සෝමාවතිය ආශ්‍රිත ප්‍රදේශය ද ඓතිහාසික අතින් වැදගත් වේ. ඒ ආසන්නයේ පිහිටි මීන්විල ක්‍රි. පූ. පළමුවන සියවසේ සිට ක්‍රි. ව. දෙවන සියවස දක්වා කාලයට අයත් සෙල්ලිපි දක්නට ලැබේ. එක් ලිපියක කෙහිගම, සුමනානගම හා කොටගම නමින් ප්‍රදේශ තුනක් පිළිබඳ ව සඳහන් ව ඇත (I.C.Vol-II,No.88). භාතිකතිස්ස (ක්‍රි. පූ. 143-67) රජුගේ කාලයට අයත් සෝමාවතී චෛතිය පුවරු ලිපියේ ද ඉහත ග්‍රාම නාම සඳහන් වන අතර කෙහිගම අතර ගඟ පෙදෙසේ වූ බව ද එහි දැක්වේ (I.C.Vol-II,No.89). මහගල්ලකනාග (ක්‍රි. පූ. 136-43) රජුගේ පුතා වූ නකළ කුමාරයා විසින් පජිනිනකල අරඹෙ විහාරය සෝමාවතියෙහි කරවා තිබේ (නිකොලස් 1961:48). කණිට්ඨතිස්ස (ක්‍රි. ව.167-186) රජු සෙල්ලිපියක සෝමාවතී දාගැබ මණිඅගය චෛතිය ලෙසින් හඳුන්වා ඇත. පෙළොන්නරුවට ඊසාන දෙසින් මහවැලි නිම්නයේ පිහිටි අතුරු දිසාවක් පුරාණයේ දී පාචීනඛණ්ඩ රාජි යනුවෙන් හඳුන්වා ඇත (ම.ව. පරි.37:ගාථා.186).

මධ්‍ය මහවැලි නිම්නයේ වූ කුඹුක්කන්දන ප්‍රදේශයේ නටඹුන් සහිත භූමියක හතරවන සියවසේ සිට හත්වන සියවස දක්වා කාලයට අයත් සෙල්ලිපි කිහිපයක් වේ. එක් ලිපියක දිසා ප්‍රධානියා හෙවත් රටියා විසූ තබරය නම් වූ ගමක් පිළිබඳ ව සඳහන් වේ (නිකොලස් 1961:49). මාඝ ආක්‍රමණ සමයේ දී සිංහල ප්‍රධානියකු මණිමේඛලා දිසාව හෙවත් වර්තමාන මිණිපේ ප්‍රදේශයේ ගංගාදෝණි කන්දේ බලකොටුවක් තනාගෙන එම ප්‍රදේශය ආරක්‍ෂා කර තිබේ.

## වාරි කර්මාන්ත

විවිධ අවස්ථාවල මහවැලි නිම්නයේ කරවන ලද වාරි කර්මාන්ත රාශියක් පිළිබඳ ව තොරතුරු වංශකථා හා සෙල්ලිපි ආශ්‍රයෙන් අනාවරණය කරගත හැකිය. මහවැලි නිම්නයේ වස්ගමුව ආශ්‍රිතව පිහිටි මාලගමුව වැව සද්ධාතිස්ස රජු විසින් ඉදිකරන ලද බවට විශ්වාසයක් පවතී. මුතුගල සෙල්ලිපියක පනගමක නමින් වූ වැවක් සඳහන් වේ (නිකොලස් 1961:46). මෝලාහිටිය වෙලේගල ගිරි ලිපියේ දපලගමකවැව, ගණ්මතක ඇළ, කෙනෙ ලවයක වැව හා පිඩවින වැටි වශයෙන් වාරි නිර්මාණ කිහිපයක් පිළිබඳ ව සඳහන් ව ඇත (E.Z.Vol-III,P-153-4). වණ්ණක ඇළ කුටකණ්ණතිස්ස (ක්‍රි. පූ. 44-22) රජු විසින් කරවා ඇත (ම.ව. පරි.34:ගාථා.32-3). එය ද මහවැලි නිම්නය ආශ්‍රිත වාරි මාර්ගයකි. මෙම රජු විසින් එම නිම්නයේ ම ආමදුර්ග හෙවත් අම්බදුන්න වැව කරවා ඇත (ම.ව. පරි34:ගාථා.32-3).

මීන්විල තිබෙන ශිලා ලේඛන කිහිපයකට මහවැලි ගඟ සමීපයෙහි පිහිටි වාරි නිර්මාණ කිහිපයක් පිළිබඳ ව සඳහන් වේ. කුටකණ්ණතිස්ස රජුගේ කාලයට අයත් මීන්විල ලිපියක " දෙගම" නම් වූ ඇළ මාර්ගයක් පිළිබඳ ව දැක්වේ (I.C.Vol- II,No.1). එහි ම තිබෙන මහාදාඨික මහානාග (ක්‍රි. ව. 7-19) රජුගේ ලිපියක "රජ ඇළ" නමින් වූ වාරි මාර්ගයක් පිළිබඳ ව සඳහන් වේ. එම රජ එකල පැවති ප්‍රධාන වාරි නිර්මාණයක් බව තහවුරු වන්නේ මීන්විලම තිබෙන තවත් ලිපි කිහිපයක ද, සෝමාවති චෛතිය පුවරු ලිපියේ ද ඒ පිළිබඳ ව සඳහන් වීම නිසාය (I.C.Vol- II,No.26, 69; I.C.,Vol-II,No.87,88,89). මෙම ඇළ නමින් ග්‍රාමයක් තිබුණු බව එක් ලිපියක සඳහන් වේ (I.C.Vol-II,No.69). මීන්විල තවත් ලිපියක පුදජිණියගම ඇළ හා හවිටක නම් වූ කුඹුරක් පිළිබඳව සඳහන් වේ. සෝමාවතී පුවරු ලිපියක රජලි කෙත නම් වූ කුඹුරක් සඳහන් ව ඇත (I.C.Vol-II,No.25). එය මුලින් සඳහන් රජ ඇළ ආශ්‍රිත වූ කෙත්බිම ලෙස අනුමාන කිරීමට පුළුවන. සෝමාවතිය ආශ්‍රිත විශාල වගුරු බිම පුරාණයේ දී වාරි මාර්ග සහිත වූ කෘෂි බිම ලෙස සැලකිය හැකිය.

මහවැලි නිම්නයේ වූ කන්දකාඩුවෙහි ගිරි ලිපියක කමරපතිය වවිය නමින් වැවක් පිළිබඳ ව සඳහන් ව ඇත (I.C.Vol-II,No.119). වසභ රජු (ක්‍රි. ව. 67-111) විසින් කරවන ලද වාතමංගන වැව (ම.ව. පරි.35:ගාථා.95) පිහිටා ඇත්තේ ද මහවැලි නිම්නයේය. මහවැලි ගඟේ ප්‍රධාන පෝෂක ගංගාව වූ අඹන්ගඟ හරස්කොට ඇළිසාර අමුණ හෙවත් ඇළහැර අමුණ කරවන ලදී

(ම.ව.,පරි.35:ගාථා.84). මනම්පිටිය ආසන්නයේ නොච්චිපොතානේ ලිපියක වලරකහෙල්ගමු නම් ඇළ මාර්ගයක් පිළිබඳ ව සඳහන් වේ (E.Z.Vol-II,No.2).

මහවැලි නිම්නයේ පිහිටි වැදගත් මෙන් ම විශාල වාරි නිර්මාණයක් වන මණිහීර වාපි හෙවත් මින්නේරි වැව කරවන ලද්දේ මහසෙන් (ක්‍රි. ව. 274-301) රජු විසිනි (ම.ව. පරි.37:ගාථා.47). එම රජු මහවැලි ගඟේ ශාඛාවක් වූ කාරගඟ හෙවත් අඹන්ගඟ හරස් කොට තැන වූ වේල්ලක් මගින් ඇරඹෙන තලවතු නම් ඇළ ඔස්සේ මින්නේරි වැවට ජලය ගෙන ගොස් ඇත. පළමුවන අග්ගබෝධි (ක්‍රි. ව. 571-604) රජු මින්නේරි වැවේ මොච් ඇළ කරවා තිබේ (ම.ව. පරි.41:ගාථා.35). පළමුවන පරාක්‍රමබාහු (ක්‍රි. ව. 1153-1186) රජු මින්නේරිය වැව ප්‍රතිසංස්කරණ කරවූ බව චූලවංශයේ සඳහන් වේ (ම.ව. පරි.79:ගාථා.32). මහසෙන් රජු විසින් මහවැලි ගඟේ සිට පබ්බත්තන හෙවත් පර්වත නමින් ප්‍රධාන ඇළ මාර්ගයක් කරවා තිබේ (ම.ව. පරි.37:ගාථා.50). එය මහවැලි ගඟ හරහා බඳින ලද අමුණකින් ආරම්භ වන්නට ඇත. මහසෙන් රජු විසින් කරවන ලද තිස්සවඩ්ඪමානක වැව (ම.ව. පරි.37:ගාථා.48) පිහිටා ඇත්තේ ද මහවැලි නිම්නයේය. වර්තමානයේ මෙම වැව කවුඩුල්ල වැව ලෙස හඳුනාගෙන ඇත. පළමුවන පරාක්‍රමබාහු රජු විසින් මෙම වැව ප්‍රතිසංස්කරණය කර තිබේ.

මහවැලි නිම්නයේ වාරි මාර්ග සංවර්ධන කටයුතු සඳහා වැදගත් දායකත්වයක් දැක්වූ රජවරුන් ලෙස පළමුවන අග්ගබෝධි (ක්‍රි. ව. 571-604) හා දෙවන අග්ගබෝධි (ක්‍රි. ව. 604-614) යන රජවරුන් සඳහන් කළ හැකිය. පළමුවන අග්ගබෝධි රජු විසින් මහවැලි නදිය හරස්කොට මණිමේඛලා හෙවත් මිණිපේ අමුණ කරවන ලදී (ම.ව.පරි.41:ගාථා.29-35). මෙය පසුකාලීන රජවරුන් ගණනාවක් විසින් ම ප්‍රතිසංස්කරණය කරන ලද වැදගත් වාරි නිර්මාණයක් විය. දෙවන අග්ගබෝධි රජු විසින් කරවූ ගංගාතට වාපි හෙවත් කන්තලේ වැව හා ගිරිතට වාපි හෙවත් ගිරිතලේ වැව පිහිටා ඇත්තේ ද (ම.ව. පරි.41:ගාථා.68) මහවැලි නිම්නයේ වම් ඉවුර ප්‍රදේශයේය. පළමුවන පරාක්‍රමබාහු රජු විසින් ගිරිතලේ වැව යළි ප්‍රතිසංස්කරණය කර තිබේ (ම.ව. පරි.79:ගාථා.33). දෙවන අග්ගබෝධි රජු විසින් තනන ලදැයි විශ්වාස කරන මෙම නිම්නයේ පිහිටි නෙරළු වැව පළමුවන පරාක්‍රමබාහු රජු විසින් යළි ප්‍රතිසංස්කරණය කර තිබේ (ම.ව. පරි.79:ගාථා.33).

මහවැලි ගඟේ පෝෂණ ජල මාර්ගයක් වූ මින්නේරිය ඔය හරස්කොට ඉදිකරන ලද පුරාණ අමුණක සාධක පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හිඟුරක්ගොඩ ආසන්නයේ හතමුණ ප්‍රදේශයේ දක්නට ලැබේ. උතුරු අක්ෂාංශ $8^0$.1.396 හා නැගෙනහිර දේශාංශ $80^0$.57.560 අතර මෙම අමුණ පිහිටා ඇත. හිඟුරක්ගොඩ හතමුණ හරහා පෙළොන්නරුව මාර්ගයේ මින්නේරි ඔයේ පාලමට මෙපිටින් දකුණු දෙසට පිහිටි මාර්ගයේ කි. මී. දෙකක් පමණ දුරින් මෙම ස්ථානය පිහිටා ඇත.

මින්නේරිය ඔය ස්වාභාවික ගල් වැටියක් සහිත ස්ථානයකින් හරස්කොට ඉදිකරන ලද මෙම පුරාණ අමුණේ සාක්ෂි ස්වල්ප ප්‍රමාණයක් මේ වන විට ශේෂ ව පවතී. ස්වභාවික ගල් වැටිය නිසා මින්නේරිය ඔයේ නිර්මාණය වන ඇල්ලක ස්වභාවය අමුණ සෑදීමට භාවිත කර තිබේ. එම ගල් වැටියට හිරවන සේ පැතලි එහෙත් තරමක් පළලැති ගල් පුවරු වරි ආකාරයට එක මත එක සිටින සේ අතුරා මෙම අමුණ සාදා තිබේ. එයින් කොටසක් මෙම ස්ථානයේ ඉදිකර තිබෙන වර්තමාන කොන්ක්‍රීට් අමුණ සමඟ සම්බන්ධ කර තිබෙන අයුරු දක්නට ලැබේ. මීටර් හයක් පමණ පළලක් සිටින සේ මෙම අමුණ නිර්මාණය කර තිබෙන බව ඔයේ වම් ඉවුර ආසන්නයේ ශේෂ ව තිබෙන ගල් ඇතුරුමෙන් පැහැදිලි වේ. ආසන්න වශයෙන් මීටර් දෙකක් පමණ උසකින් මෙම අමුණ යුක්ත වන්නට ඇතැයි සිතිය හැකිය. ගල් පුවරුවල දාර මැනවින් බද්ධ වන සේ ගල් වරි සකස්කර තිබෙන බව හඳුනාගැනීමට පිළිවන. මෙම අමුණේ මධ්‍ය කොටසේ විශාල ප්‍රමාණයක් ද දකුණු කොටසේ සම්පූර්ණයෙන් ද ගල් ගැලවී විනාශ වී ගොස් ඇත. එලෙස ගැලවී ගිය ගල් පුවරු අමුණ ආශ්‍රිත ව ඇල්ලට පහළින් මින්නේරි ඔයේ දක්නට ලැබේ.

වංශකතාවේ මණිමේඛලා, මිණිමෙවුලා නමින් හැඳින්වූ පුරාණ මිණිපේ අමුණ ඉදිකිරීම පිළිබඳ ව ප්‍රථමයෙන් වාර්තාවන්නේ පළමුවන අග්ගබෝධි (ක්‍රි. ව. 517-604) රජුගේ කාලයේදීය (ම.ව. පරි.41:ගාථා.34). අනතුරු ව දෙවන සේන (ක්‍රි. ව. 853-887) රජු විසින් ද මෙය නැවත වතාවක් කරවූ බව සඳහන් වේ (ම.ව. පරි.51:ගාථා.72). කෙසේ වෙතත් මෙම කලාපයේ පැවති ජනප්‍රවාදයන් අනුව යමින් බ්‍රෝහියර් පවසන්නේ මෙම අමුණ හා ඇළ මාර්ගය ප්‍රදේශයේ වාසය කළ වැදි ජන කොට්ඨාසයන්ගේ සහභාගීත්වයෙන් දාසෙන්කැළි රජු විසින් ප්‍රථමයෙන් ඉදි කළ බවකි (බ්‍රෝහියර් 2001). දාසෙන්කැළි රජු යනු ධාතුසේන රජු (ක්‍රි. ව. 455-473) ලෙස හඳුනාගෙන ඇත. චූලවංශයේ ධාතුසේන රජු පිළිබඳ ව දැක්වෙන තොරතුරුවල එම රජු විසින් මහා ගංගාව හරස්කොට බඳවා කුඹුරු දිය තරකළ බව සඳහන් වේ (ම.ව. පරි.38:ගාථා.41). මහා ගංගා යනු මහවැලි නදිය වේ. ඒ අනුව ධාතුසේන රජු මහවැලි ගඟ හරස්කොට අමුණක් බැඳ වූ බව තහවුරු වේ. ඔහු විසින් ඉදිකරනු ලැබූ අමුණක් පිළිබඳ ව මහවැලි නදියේ වෙනත් කිසිදු ස්ථානයකින් තොරතුරු හමු නොවන බැවින් ධාතුසේන රජු ඉදිකරවන ලද අමුණ මිණිපේ අමුණ ම විය හැකි බව අනුමාන කළ හැකිය. ධාතුසේන රජු එම ප්‍රදේශයේ වාසය කළ ස්වදේශික යක්ෂ ගෝත්‍රික ජනතාවගේ සහයෙන් මෙම අමුණ ඉදිකළ බවට ජනප්‍රවාදයේ සඳහන් තොරතුරු, වංශකථාවේ දැක්වෙන කරුණු සමග කිසියම් ප්‍රමාණයකට සම්බන්ධ වේ. අමුණ පිහිටා තිබෙන ස්ථානය යකුන්දෑව නමිනුත් ඇළ මාර්ගය යකාබැඳි ඇළ ලෙසිනුත් හඳුන්වා තිබීමෙන් ද මෙම ස්ථානය හා ජනප්‍රවාද අතර තිබෙන සම්බන්ධතාවය පිළිබඳ ව අදහසක් ලබාගත හැකිය. ඒ අනුව මෙම අමුණේ ප්‍රථම නිර්මාපකයා ලෙස නිගමනය කළ හැකි වන්නේ ධාතුසේන රජු ය. පුරාණ මිණිපේ අමුණ සම්බන්ධයෙන් පළමුවන අග්ගබෝධි හා දෙවන සේන රජුවරුන්ගේ කාලයේ දැක්වෙන චූලවංශයේ තොරතුරු විමර්ශනය කරන විට හැඟී යන්නේ එම රජවරුන් මෙම අමුණ අවස්ථා දෙකක දී අලුත්වැඩියා කරන්නට ඇති බවය.

අඹන්ගඟ සුදුකන්ද පාමුල දී හරස්කොට ඉදිකරන ලද අංගම්මැඩිල්ල පුරාණ අමුණ පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව ආසනයේ පිහිටා ඇත. පොළොන්නරුව කලහගල අංගම්මැඩිල්ල මාර්ගයේ කි. මී. 18 ක් පමණ දුරින් මෙම පුරාණ අමුණේ සාක්ෂි දක්නට ලැබේ. වර්තමාන අමුණ ඉදිකර ඇත්තේ ද පුරාණ අමුණ ආශ්‍රිත වය. එය ක්‍රි. ව. 1948-52 අතර කාලයේ ගොඩනගන ලද්දකි.

පළමුවන පරාක්‍රමබාහු (ක්‍රි. ව. 1153-1186) රජු විසින් ඉදිකරන ලද පරාක්‍රම සමුද්‍රයට අවශ්‍ය ජල සම්පාදනය පිණිස මෙම අමුණ කරවූ බව චූලවංශයේ සඳහන් වේ (ම.ව.පරි.79:ගාථා.25-27). රජු විසින් කාරගඟ විශාල ගල්වලින් හරස්කොට අමුණ සාදා එතැන් සිට ආකාශ ගංගා නමින් සකස් කරන ලද ඇළ මාර්ගයක් ඔස්සේ පරාක්‍රම සමුද්‍රයට ජලය සැපයූ බව එහි සඳහන් වේ. කාරගඟ අඹන් ගඟ ලෙස හඳුනාගෙන තිබෙන බැවින් චූලවංශයේ සඳහන් එම තොරතුරු නිවැරදි බව පැහැදිලි ය. මෙම පුරාණ අමුණ ආශ්‍රිත ගල් පුවරුවල දක්නට ලැබෙන කැඩුම් ලකුණු පොළොන්නරු යුගය නියෝජනය කරන ආයත චතුරස්‍රාකාර ස්වරූපය ගන්නා බැවින් මෙම අමුණ පරාක්‍රමබාහු රජුගේ කාලයේ දී ඉදි කළ බවට වංශකථාවේ සඳහන් වන තොරතුරු නිවැරදි බව තහවුරු වේ. මේ වන විට බෙහෙවින් ම විනාශ වී ගොස් තිබෙන මෙම පුරාණ අමුණේ සාක්ෂි ස්වල්ප වශයෙන් දක්නට ලැබෙන්නේ අඹන්ගඟේ වම් ඉවුර ආසන්න ප්‍රදේශයේ පමණි. මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි මෙම අමුණ අඹන් ගඟේ ප්‍රධාන ශාඛාව වන කළුගඟ හරස් කර ඉදිකරන ලද්දකි. මෙම පුරාණ අමුණ උතුරු අක්ෂාංශ $7^{0}$.34.331 හා නැගෙනහිර දේශාංශ $80^{0}$.50.156 අතර පිහිටා තිබේ. මෙම ප්‍රදේශයේ දී කළුගඟ උතුරු දෙසට ගලා බසින අතර අමුණු බැම්ම වයඹ ගිනිකොණ දිශානුගත ව ඉදිකර තිබී ඇත. ඇළහැර සිට පල්ලේගම මාර්ගයේ සැතපුම් 12 ක් පමණ දුරින් පිහිටි කළුගඟ හත්තොට අමුණ ග්‍රාමයෙන් මෙම ස්ථානයට පිවිසිය හැකිය.

දෙවන අග්ගබෝධි (ක්‍රි. ව. 604-614) රජු විසින් හත්තොට අමුණ ප්‍රථමයෙන් ඉදිකර තිබෙන අතර පළමුවන පරාක්‍රමබාහු රජු විසින් යළි ප්‍රතිසංස්කරණය කළ බව ද වාර්තා වේ (නිකොලස් 1961:20). මහසෙන් රජුගේ මින්නේරිය වැව හා සම්බන්ධ වාරි ව්‍යාපාරයට සම්බන්ධ වන ලෙස

දෙවන අග්ගබෝධි රජු විසින් කරවන ලද ගිරිතට වාපි නොහොත් ගිරිතලේ වැව හා ගංගාතට වාපි නොහොත් වර්තමාන කන්තලේ වැව (ම.ව. පරි.41:ගාථා.68) යන වැව්වලට අවශ්‍ය ජල සම්පාදනයේ දී ඇළහැර අමුණෙන් ලබාගත් අඹන්ගඟේ ජලය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අවශ්‍ය අතිරේක ජල සම්පාදනය පිණිස මෙම අමුණ ප්‍රථමයෙන් ඉදිකරන්නට ඇති බව සිතිය හැකි වේ.

මෙම අමුණ හා ඉන් ඇරඹෙන ඇළ මාර්ගය සම්බන්ධයෙන් ප්‍රථමවරට වාර්තා කර ඇත්තේ 1856 දී ඇලෙක්ස් යන්ග් ඇඩම්ස් විසිනි. හත්තොට අමුණෙන් ඇරඹෙන යෝධියබැඳි ඇළ නම් වූ ඇළ මාර්ගය ඇළහැර අමුණ සමග එකතු වන බවට ජනප්‍රවාදයේ පැවති මතයක් අනුව ඔහු එම ඇළ මාර්ගය පිළිබඳ ව පරීක්ෂා කර බලා තිබේ. එයින් පරාක්‍රම සමුද්‍රයට ජලය සම්පාදනය කිරීමේ ක්‍රමවේදයක් පිළිබඳ ව අදහසක් ද ඇඩම්ස් ඉදිරිපත් කර තිබේ. ඇඩම්ස්ගේ වාර්තා අනුව යමින් බ්‍රෝහියර් ද යෝධියබැඳි ඇල හා හත්තොට අමුණ පිළිබඳ ව වාර්තා කර ඇත.

මතුපිට සමතලා නොවූ ස්වභාවික ගල් තලාවක් ආශ්‍රිත ව ඉදි කර තිබූ මෙම පුරාණ අමුණේ වර්තමානයේ ශේෂ ව පවතින්නේ බැම්මේ දකුණු කෙළවරේ ඉතා සුළු කොටසක් පමණි. ගල් තලාවේ ස්වාභාවික පිහිටීම අමුණ ඉදිකිරීමට මැනවින් උපයෝගී කරගත් බවට සාක්ෂි වේ. කළුගඟ හරහා සම්පූර්ණයෙන් ම පැතිරී තිබෙන මෙම ගල් තලාව ගඟේ දකුණු දෙසින් තිබෙන කන්දේ බෑවුමට සම්බන්ධ වන අතර වම් ඉවුර ආශ්‍රිත ව ඉහළට ඉලිප්පී ගං ඉවුර හා සම්බන්ධ වී ඇත. එමෙන් ම කළුගඟ මැද දී මෙම ගල් තලාව ගඟ පහළට විහිදුණ නාරටියක ස්වරූපයෙන් ඉහළට ඉලිප්පුණු ස්වරූපයකින් යුක්ත වේ. මේ නිසා ගඟ පහළට ගල් අතරින් විහිදුණු දෙබොක්කාවක ස්වරූපයක් ගඟ මැද ස්ථාන කිහිපයක නිර්මාණය වී ඇත. අමුණේ දකුණු කොටසේ ඉතිරිව තිබෙන සාක්ෂි අනුව පැහැදිලිවන්නේ එම කොටස කළුගඟේ දකුණු ඉවුර ආසන්නයේ නිර්මාණය වී තිබෙන ස්වභාවික ගල් වැටිය අතර වූ හිඩැසට හිරකර තිබූ බවකි. කළුගඟ මධ්‍යයේ ගල් තලාවේ දක්නට ලැබෙන නාරටි ස්වරූපයක් ගත් ඉලිප්පීම් ද අමුණට සම්බන්ධ වන ආකාරයට ගල්වැටි අතර වූ හිඩැස් ගල් කුට්ටි යොදා පිරවීම මගින් අමුණ නිර්මාණය කරන්නට ඇති බව නිගමනය කළ හැකිය. ඒ අනුව හත්තොට පුරාණ අමුණ කළුගඟ හරහා සම්පූර්ණයෙන් ම විහිදී යන ආකාරයට සැලසුම් කරන ලද අමුණක් නොව ගල් තලාවේ පිහිටීම භාවිත කරමින් පහළට ජලය ගලා යන ස්ථාන පමණක් ආවරණය කිරීම මගින් ඉදිකරන ලද නිර්මාණයක් බව පෙනේ.

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇළහැර ප්‍රදේශයේ දී අඹන්ගඟ හරස්කොට ඉදිකර තිබෙන ඇළහැර අමුණ මේ වන විට ශේෂ ව පවතින පුරාතන අමුණුවලින් විශාලතම නිර්මාණය ලෙස සැලකිය හැකිය. උතුරු අක්ෂාංශ $7^0$ 42.266 හා නැගෙනහිර දේශාංශ $80^0$ 47.029 අතර පිහිටා තිබෙන මෙම අමුණු සහිත භූමියේ මුහුදු මට්ටමේ උස මීටර් 160 ක් පමණ වේ. නාවුල ඇළහැර මාර්ගයේ 12 වන සැතපුම අසලින් මෙම ස්ථානයට පිවිසිය හැකිය.

වංශකතාවේ සඳහන් වන පැරණිතම අමුණ ලෙසින් සැලකිය හැකි මෙහි ප්‍රථම නිර්මාපකයා වනුයේ වසභ (ක්‍රි. ව. 67-111) රජු ය. ශ්‍රී ලංකාවේ විශාල වාරි කර්මාන්තවල ආරම්භකයා වන එම රජු විසින් ඇළ මාර්ග 12 ක් කරවන ලද බවට මහාවංසයේ සඳහන් වුව ද නමින් දක්වා ඇත්තේ ඇළහැර ඇළ පිළිබඳ ව පමණි. මහාවංසයේ එය ආළිසාර නමින් හඳුන්වා තිබේ. මෙහි දිය බද්ද වසභ රජු විසින් තිස්වඩමන්හි මූවෙල විහාරයට පිදූ බව සඳහන් වේ (ම.ව. පරි.35:ගාථා.83-5). මෙම විහාරය කවුඩුල්ල වැව අසල පිහිටා තිබෙන නටබුන් වූ විහාරය ලෙස හඳුනාගෙන ඇත (නිකොලස් 1961:294). මෙයින් පැ:ාැදිලිවන්නේ වසභ රජු විසින් මෙම අමුණේ ජලය ආරම්භයේ දී ම දීර්ඝ දුරක් ගෙන ගොස් තිබෙන බවකි. ඒ අනුව මින්නේරිය හා කවුඩුල්ල යන වැව් තැනීමට පෙර ඇළහැර ඇළ මාර්ගය තනා තිබුණු බව පැහැදිලිය (නිකොලස් 1961:294). ඇතැම් විටෙක මහසෙන් රජුට මින්නේරිය හා කවුඩුල්ල වැව් කරවීමට වසභ රජු විසින් තනවන ලද ඇළහැර අමුණෙන් ආරම්භ වූ ආළිසාර ඇළ මාර්ගය ද හේතුවන්නට ඇත.

මහසෙන් (ක්‍රි. ව. 274-301) රජු විසින් ඉදිකළ මින්නේරිය වැවට අවශ්‍ය අතිරේක ජල සම්පාදනය උදෙසා එම රජු විසින් කරගඟ හෙවත් අඹන් ගඟ හරස්කොට අමුණ බැන්ඳ වූ බව රාජාවලියේ සඳහන් වේ (රාජාවලිය 1997:197). ඒ අනුව මහසෙන් රජු ඇළහැර අමුණු බැම්ම යළි උස්කොට බැඳ තිලවත්ථුක හෙවත් තලවතු නම් ඇළ මාර්ගය ඔස්සේ මින්නේරිය වැවට ජලය ලබා දී තිබෙන බව පැහැදිලි වේ. තලවතු ඇළ නමින් හඳුන්වන්නේ ඇළහැර ඇළ මාර්ගයෙන් මින්නේරිය වැවට ජලය ලබාගැනීමට සකස් කරන ලද වෙන ම ඇළ මාර්ගයක් ලෙස හඳුනාගත හැකිය. එය ස්වභාවික ජල මාර්ගයක් ඔස්සේ සකස් කරන ලද ඇළ මාර්ගයක් බව පැහැදිලිය. වර්තමානයේ මෙම ඇළ මාර්ගය තල්වතුර ඔය නමින් හැඳින්වේ.

දෙවන අග්ගබෝධි (ක්‍රි. ව. 604-614) රජු විසින් නිර්මාණය කරවන ලද ගංගාතට වාපි හෙවත් කන්තලේ වැවට හා ගිරිතට වාපි හෙවත් ගිරිතලේ වැව යන වැව්වලට (ම.ව.පරි.41:ගාථා.68) අවශ්‍ය ජල සම්පාදනය සඳහා ඇළහැර අමුණ යළි ප්‍රතිසංස්කරණය කොට ශක්තිමත් ව ඉදිකරන්නට ඇති බව සිතිය හැකිය. ඇළහැර ඇළෙන් තලවතු ඇළ ආරම්භ වන ස්ථානයේ සිට ඇරඹෙන වෙනත් ඇළ මාර්ගය ඔස්සේ ගිරිතලේ වැවට ජලය ලබා දී ඇති අතර මින්නේරි වැවේ සිට සකස් කර ඇති ඇළ මාර්ගය ඔස්සේ කන්තලේ වැවට ජලය සපයා දී තිබේ.

පළමුවන විජයබාහු (ක්‍රි. ව. 1055-1110) රජු 'කඳුරු ගං හෝවල දිය නවත්වා වේලි බැඳි රට සුභික්ෂ කරවූ බව' චූලවංසයේ සඳහන් වන අතර, ඇළහැර ඇළෙන් ආරම්භ වූ මින්නේරිය වැවේ ප්‍රධාන ජල සම්පාදන ඇළ මාර්ගය වූ තලවතු නම් අබලන් වූ ප්‍රධාන ඇළ මාර්ගය ද යළි ප්‍රතිසංස්කරණය කළ බව සඳහන් වේ (ම.ව. පරි.60:ගාථා.52-4). ඒ අනුව ඇළහැර අමුණ ද මෙම රජුගේ අවධානයට ලක්වන්නට ඇති බව සිතිය හැකිය. පළමුවන පරාක්‍රමබාහු (ක්‍රි. ව. 1153-1186) රජු මින්නේරිය, ගිරිතලේ වාරි ව්‍යාපාරය යළි ප්‍රතිසංස්කරණය කරන ලද අතර (ම.ව. පරි.79:ගාථා.32-3) ඒ සඳහා ප්‍රධාන ජල සම්පාදන ක්‍රමය වූ ඇළහැර අමුණ යළි ප්‍රතිසංස්කරණය කරන්නට ඇත.

පුරාණ ඇළහැර අමුණ සම්බන්ධයෙන් ප්‍රථමවරට පරීක්ෂා කර ඇත්තේ ඇඩම්ස්, චර්ච්හිල් හා බේලි විසිනි. ඔවුන් ඇළහැර අමුණ පිළිබඳ ව පමණක් නොව ඉන් ඇරඹෙන ඇළ මාර්ග පිළිබඳව ද පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර තිබේ. එම තොරතුරු ඔස්සේ යමින් හෙන්රි වෝඩ් විසින් ද තම නිරීක්ෂණයන් වාර්තාකර ඇත. මෙම නිරීක්ෂණ වාර්තා අනුව පැහැදිලි වන්නේ පුරාණ අමුණේ නටබුන් ඒ වන විට වර්තමානයට වඩා සුරක්ෂිත ව පැවති බවය. එම තොරතුරු අනුව මෙම ස්ථානයේ යාර 130 ක් පමණ දිගකින් යුතු වූ ගල් වද්දවා සෑදූ විශාල බැම්මක් තිබී ඇත. එහි කෙළවර යාර 90 ක් පමණ දිගකින් යුතු වූ ද අඩි 15 ක් පමණ උසකින් යුතු වූ ද විශාල ගල් වානක් තිබුණු බවත් ඒ වන විට එහි යාර 76 ක් පමණ කොටසක් ඉතිරි ව තිබෙන බවත් සඳහන් කර තිබේ.

පැරණි අමුණේ ඉතිරි ව තිබෙන අවසන් කෙළවරින් ආරම්භ වන පරිදි ඉදිකර තිබෙන නව අමුණේ සම්පූර්ණ දිග මීටර් 122.5 කි. මේ වන විට අඹන් ගඟේ දකුණු ඉවුරේ සිට ඔය දෙසට පැරණි අමුණු බැම්මේ මීටර් 62 ක පමණ කොටසක් ඉතිරි ව තිබේ. දැනට තිබෙන සාක්ෂි අනුව වර්තමාන අමුණ පිහිටා තිබෙන ප්‍රමාණය ද ආවරණය වන පරිද්දෙන් පුරාණ අමුණ ද ඉදිකර තිබෙන්නට ඇති බව සිතිය හැකිය. ඒ අනුව පුරාණ අමුණ මීටර් 185 ක් පමණ දිගකින් යුක්තවන්නට ඇති බව නිගමනය කළ හැකිය. පුරාණයේ ඉදිකරන ලද විශාල ප්‍රමාණයේ අමුණු අතරින් වැඩි ම කොටසක් සුරක්ෂිත ව ඇත්තේ ඇළහැර පුරාණ අමුණේ පමණි. එය අමුණේ විශාලත්වයෙන් ආසන්න ප්‍රතිශතයක් ලෙස ගතහොත් සියයට හතලිස්පහක් (45%) පමණ වන බව පෙනේ. කෙසේ වෙතත් දැනට ශේෂ ව තිබෙන කොටස ඇසුරින් මෙම පුරාණ අමුණේ නිර්මාණාත්මක ස්වරූපය පිළිබඳ ව තොරතුරු රැසක් අනාවරණය කරගත හැකිය.

## ආශ්‍රේය ග්‍රන්ථ


නිකොලස්, සී. ඩබ්. 1979. *පුරාතන හා මධ්‍යතන ලංකාවේ ඓතිහාසික ස්ථාන විස්තරය*, රාජකීය ආසියාතික සංගමය (ශ්‍රී ලංකා ශාඛාව), තිසර ප්‍රකාශකයෝ, දෙහිවල.

බ්‍රෝහියර්, ආර්. එල්. 2002. *ලක්දිව පුරාතන වාරි මාර්ග*, මහවැලි කේන්ද්‍රය. කොළඹ.

*මහාවංසය* (ම.ව.). 1967. බටුවන්තුඩාවේ සුමංගල හිමි සහ හික්කඩුවේ දේවරක්ෂිත (සංස්.), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

*රාජාවලිය*, 1997. ඒ. වී. සුරවීර (පරි). අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල

Arumugam, S. 1969. *Water Resources of Ceylon*, Water Resources Board Publication, Colombo.

*Epigraphiya Zeylanica* (E.Z.). 1912. Vol I, D. M. D. Z Wickramasingha (ed.), Oxford University Press, London.

*Epigraphiya Zeylanica* (E.Z.). 1928. Vol II, D. M. D. Z Wikramasingha (ed.), Oxford University Press, London.

*Epigraphiya Zeylanica* (E.Z.). 1933. Vol III, S. Paranavitana (ed.), Oxford University Press, London.

*Epigraphiya Zeylanica* (E.Z.). 1943. Vol III, S. Paranavitana (ed.), Oxford University Press, London.

*Epigraphiya Zeylanica* (E.Z.). 1955. Vol V, S. Paranavitana (ed.), Department of Archaeology, Colombo.

*Inscription of Ceylon* (IC). 1970. Vol I, S. Paranavitana (ed.), Department of Archaeology, Colombo.

*Inscription of Ceylon* (IC). 1983. Vol II, Part I, S. Paranavitana (ed.), Department of Archaeology, Colombo.

*Inscription of Ceylon* (IC). 2001. Vol II, Part II, S. Paranavitana (ed.), Department of Archaeology, Colombo.

Inscription of Ceylon (IC). 2001. Vol V, Part I, S. Ranawella (ed.), Department of Archaeology, Colombo.

Paranavitana, S. 1958. Some regulation Concerning Village Irrigation works in Ancient Ceylon, *The Ceylon Journal of Historical and Social Studies*, 1(1), Pp 1–7.